12-01-2019 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, සෙත සලසන පියාගේ දරුවන්ගේ කාර්යය වන්නේ, සියලු දෙනාට සෙත සැලසීමය. සියලු දෙනාටම පියා ගැන සිහි කර දී, ඔවුන්ට දැනුම පරිත්‍යාග කරන්න.

**ප්‍රශ්නය:** බාබා, මහාරතීන් ලෙස හඳුන්වන්නේ කුමන දරුවන්වද? ඔවුන්ගේ සලකුණු මොනවාද?

**පිළිතුර:** හොඳින් ඉගෙනගෙන, අන් අයට උගන්වන, නිරතුරුවම ගුරුගේ දසාව ඔවුන් මත තිබෙන අය, තමන්ගේ ප්‍රගතිය මෙන්ම අන් අයගේ ප්‍රගතිය ගැන නිරතුරුවම සැලකිලිමත් වන අය, තම ඇට මිදුළු වලින් යඥාවට සේවය කරන අය සහ බාබාගේ කාර්යයට උදව්කරුවන් වන අය, මහාරතීන්ය. එවන් මහාරතී දරුවන් ගැන බාබා පවසන්නේ මේ මගේ වටිනා දරුවන්ය.

ඕම් ශාන්ති. මේ දිනවල ඔය දරුවන් ශිවරාත්‍රිය වෙනුවෙන් සූදානම් වනවා. කාඩ්පත් ආදිය ද මුද්‍රණය කෙරෙනවා. පියා බොහෝ වාර ගණනාවක විස්තර කර දී තිබේ. සෑම දෙයක්ම ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ ගීතාව මතයි. මනුෂ්‍යයන් විසින් ලියා ඇති ගීතාව හැදෑරීමෙන්, ඔබ කල්ප භාගයක්ම නොකඩවා පහළට පැමිණ ඇත. කල්පයෙන් භාගයක් එය දහවල වන අතර කල්ප භාගයක් එය රාත්‍රිය බවත් වැටහෙන්නේ ඔය දරුවන්ට පමණයි. ඔබ ආවර්ජනය කළ යුතු මාතෘකා, බාබා ඔබට දැන් ලබා දෙනවා. ඔබට මෙසේ ලිවිය හැක සහෝදර සහෝදරියනේ, පැමිණ වටහාගන්න! එක් ගීතා ශාස්ත්‍රය, ඥානය පිළිබඳව වන අතර, ඉතිරි සියල්ලම, භක්තියේ ග්‍රන්ථ ශාස්ත්‍රයි. වඩාත්ම ශුභ, සංගම යුගයේදි, පරම පියා, පරමාත්ම ජීවය, ත්‍රිමූර්ති ශිවා වන අසීමිත පියා පවසන, ඥානයේ එක ශාස්ත්‍රයක් තිබේ. එසේ නැත්නම් ඔබට මෙසේ ලිවිය හැක උපත් 21කට විමුක්තිය ලැබෙන, බ්‍රහ්මාගේ මාර්ගයෙන් ඔහු පවසන. ඥානයේ ගීතාව තුළින් ඔබට උපත් 21කට උරුමය හිමිවන අතර ඉන්පසුව මනුෂ්‍යයන් පැවසූ භක්තියේ ගීතාව, උපත් 63ක් පවතී. පියා ඔබට රාජයෝගාව උගන්වා ඔබට විමුක්තිය පිරිනමයි. ඉන්පසුව නැවත එයට සවන් දීමට අවශ්‍යතාවයක් නැත. ඥානයේ ගීතාව තුළින් එය දහවල වෙයි. ඥාන සාගරය වන පියා පමණයි එය පවසන්නේ, එවිට එය තුළින් අචල, නොසෙලවෙන ස්වර්ණමය-යුග රාජ්‍යයේ, ගැලවීම සහ විමුක්තිය උපත් 21කට තිබෙයි, එනම් ඔබට 100% පවිත්‍රතාවය, සතුට සහ සාමය ලැබෙයි. උපත් 21කට ඉහළ නැඟීමේ තත්ත්වය තිබෙයි. මනුෂ්‍යයන් විසින් ලියන ලද ගීතාව තුළින් පහළ බැසීමේ තත්ත්වය ඇති වෙයි. භක්තියේ ගීතාව සහ ඥානයේ ගීතාව අතර වෙනස්කම් ඔබ ඉතා හොඳින් ආවර්ජනය කළ යුතුයි. මිනිසුන් නොදන්නා ප්‍රධාන දෙය මෙයයි. ඔබ මෙසේ ලියයි ත්‍රිමූර්ති ශිව ජයන්තිය ශ්‍රීමත් භගවත් ගීතා ජයන්තියද වන අතර එය සියලු දෙනාගේ විමුක්තියේද ජයන්තියයි. ඔබට ඔවුන්ට මෙසේද කිව හැක ශිව ජයන්තිය, මුළු ලොව පුරාම සාමය ගෙන එයි. ප්‍රධාන වචන අත්‍යාවශ්‍ය වන අතර සෑම දෙයක්ම රඳා පවතින්නේ මෙය මතයි. මනුෂ්‍යයන්ට, වෙනත් මනුෂ්‍යයන්හට විමුක්තිය ලබා දිය නොහැකි බව, ඔබට සියලු දෙනාටම කිව හැක. විමුක්තිය පිරිනැමීම සඳහා දෙවියන් වඩාත්ම ශුභදායක සංගම යුගයේදී පැමිණෙන අතර, මෙය දැන් සිදුවෙමින් පවතිනවා. ප්‍රධාන කරුණු දෙක හෝ තුන මේවායි. ශිවාගේ ගීතාව සහ ක්‍රිෂ්ණාගේ ගීතාව අතර වෙනස, නිසැකවම තිබේ. සංගම යුගයේදි, ත්‍රිමූර්ති ශිව දෙවියන්ගෙන්, ගීතාවට සවන් දීමෙන්, විමුක්තිය හිමිවෙයි. අන් අය මත බලපෑමක් ඇති විය හැක්කේ, කෙනෙක් මෙවැනි කරුණු මතගාන විට පමණයි. මනුෂ්‍යයන්ට කිසිම විටෙක මනුෂ්‍යයන්හට විමුක්තිය පිරිනැමිය නොහැක. මෙම වඩාත්ම ශුභ සංගම යුගයේදි, සියලු දෙනාටම විමුක්තිය ලබා දෙන්නේ, ගුරුවරයා සහ සත්ගුරු ද වන, ත්‍රිමූර්ති පරම පියා, පරමාත්ම ජීවය, ශිවාය. කාඩ්පත් වලද කෙටියෙන් ලිවිය යුතුයි. කාඩ්පතෙහි මෙසේ ලියන්න සිප්පි කටුවක් වැනි අපවිත්‍ර, කලි යුගයේ මනුෂ්‍යයෙකුගෙන්, දියමන්තියක් වැනි, පිවිතුරු දේවතාවක් බවට පරිවර්තනය වීම සඳහා දේවමය ආරාධනාවක්. ඔබ මෙය ලියන විට, සමරනු ලබන්නේ, විමුක්තිය පිරිනමන්නා වන පියාගේ ශිව ජයන්තිය බව වැටහී, මිනිසුන් සතුටින් පැමිණෙයි. ලියවිල්ල, ඉතා පැහැදිලි වචන වලින් විය යුතුයි. භක්ති මාර්ගයේ මිනිසුන් බොහෝ ග්‍රන්ථ ශාස්ත්‍ර හදාරමින් වෙහෙසට පත් වෙයි. මෙහිදී ඔබට පියාගෙන් තත්පරයකදී මුක්තිය සහ ජීවන-මුක්තිය හිමි වෙයි. ඔබ පියාට අයත් වී, ඔහුගෙන් ඥානය ලබාගන්නා විට, ඔබට අනිවාර්යෙන් ජීවන-මුක්තිය හිමි වෙයි. ඔබ ප්‍රථමයෙන් මුක්තිය වෙත ගොස්, ඉන්පසුව ඔබ කෙතරම් උත්සාහ දරා තිබෙන්නේද, එයට අනුකූලව අනිවාර්යෙන් ජීවන-මුක්තිය වෙතට යයි. ඔබට නියත වශයෙන්ම ජීවන-මුක්තිය ලැබෙයි, නමුත් ඔබ පැමිණෙන්නේ මුලින්ද, අවසානයේද පිළිබඳ කරුණ තිබෙයි. ප්‍රථමයෙන් ඔබ ජීවන-මුක්තිය වෙතට යන අතර ඉන්පසුව ඔබට බන්දන-ජීවිතයක් තිබෙයි. ඔබ මෙවන් ප්‍රධාන කරුණු ධාරණය කරගන්නේ නම්, ඔබට බොහෝ සේවය කළ හැක.

ඔබ පියා හඳුනන්නේ නම්, අන් අයට ද ඔහුගේ හැඳින්වීම ලබා දෙන්න. ඔබ අන් අයට හැඳින්වීම ලබා නොදෙන්නේ නම්, ඉන් කියැවෙන්නේ ඔබට කිසිම දැනුමක් නොමැති බවයි. ඔබ විස්තරයක් ලබා දෙන නමුත් එය ඔවුන්ගේ භාග්‍යයේ නැත. ඔබ යහපත ගෙන එන පියාගේ දරුවන් බැවින් ඔබ යහපතක් සැලසිය යුතුයි. එසේ නැත්නම් ඔබ ශිව බාබාගේ දරුවන් බව නිකමට පවසන නමුත්, ඔබ කිසි කෙනෙකුට යහපතක් සිදු නොකරන බව, පියා සිතයි. ඔවුන් ධනවත් වුවත් දුප්පත් වුවත්, ඔබ සියලු දෙනාටම සෙත සැලසිය යුතුයි. කෙසේවෙතත් ඔවුන්ට කාලය තිබෙන බැවින්, දුප්පත් අය මෙම දැනුම පළමුව ලබාගනු ඇත. එය නාටකයේ, ඒ ආකාරයට නියම වී තිබේ. දැන් එක් ධනවතෙක් පැමිණෙන්නේ නම්, තව බොහෝ දෙනෙක් ඔහු පසුපස පැමිණෙනු ඇත. එවන් වර්ණනාවක් දැන් මතු වන්නේ නම්, බොහෝ දෙනෙක් මෙහි පැමිණෙයි. ඔබගේ එය, දේවමය තත්ත්වයකි. ඔබ තමන්ට මෙන්ම අන් අයට ද යහපතක් සිදු කරයි. තමන්ට යහපතක් අත් කර නොගන්නා අයට, අන් අයට යහපතක් සැලසිය නොහැක. පියා සෙත සලසන්නාය. ඔහු සියලු දෙනාටම විමුක්තිය සලසන්නාය. ඔබත් ඔහුගේ උදව්කරුවන්ය. ඒවා භක්ති මාර්ගයේ නිමිති බව ඔබ දන්නවා. විමුක්ති මාර්ගයට තිබෙන්නේ එක් නිමිත්තක් පමණයි. හොඳින් ඉගෙනගෙන අන් අයට උගන්වන අය මත, ගුරුගේ දශාව තිබේ. එවන් අය, මහාරතීන් ලෙස හැඳින්වෙයි. ඔබගේ හදවතින් විමසන්න මා මහාරතී කෙනෙක්ද? මම අහවලා මෙන් සේවය කරනවාද? පාබල සේනාවට, කිසිවෙකුට ඥානය ලබා දිය නොහැක. ඔබ කිසිවෙකුට යහපතක් සලසන්නේ නැත්නම්, ඔබ සෙත සලසන පියාගේ දරුවෙක් ලෙස තමන්ව හඳුන්වන්නේ කුමටද? පියා ඔබට උත්සාහ දැරීමට දිරිමත් කරයි. ඔබගේ ඇට මිදුළු වලින් ඔබ මෙම යඥ්‍යාවට සේවය කළ යුතුයි. කෙසේවෙතත් නිකම්ම කා, බී, නිදා ගැනීම එය සේවය කිරීමද? එවන් අය, පුරවැසියන්ගේ දාසයන් සහ සේවකයන් වෙයි. පියා පවසන්නේ උත්සාහ දරා, සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන් වන්න. අගනා සහ කීකරු දරුවන් දැකීමට, පියා සතුටු වෙයි. ඔහුගේ දරුවා ඉතා හොඳ තත්ත්වයක් ලබන බව භෞතික පියෙක් දකින විට, ඔහු බොහෝ සතුටට පත්වෙයි. පාරලෞකික පියාද එම දේම පවසයි. අසීමිත පියා පවසන්නේ මා ඔබව ලෝකයේ අධිපතියන් කරවීමට පැමිණ සිටිනවා. ඔබ දැන් අන් අයවත් එය බවට පත් කළ යුතුයි. තමන් ගැන පමණක් බලාගැනීමෙන් ඇති යහපත කුමක්ද? සියලු දෙනාට පවසන්න ශිව බාබා සිහි කරන්න. ආහාර ගන්නා වෙලාවට අන් අයට පියාව සිහි කරවන්න, එවිට සියලු දෙනාම මෙසේ කියයි මේ කෙනා තුළ ශිව බාබා කෙරෙහි බොහෝ සෙනෙහස තිබේ. මෙය පහසුයි නේද? මෙහි පාඩුවක් තිබේද? මෙම පුරුද්ද ඔබ සනිටුහන් කරගත් විට, ඔබ ආහාර ගන්නා විට පවා ඔබ නොකඩවා පියා සිහි කරනු ඇත. ඔබ අනිවාර්යෙන් දිව්‍යමය ගුණධර්ම ද ධාරණය කරගත යුතුයි. දැන් සියලු දෙනාම කන්නලව් කරන්නේ අහෝ පාරිශුද්ධකරු වඩින්න! එබැවින් ඔවුන් නිසැකවම අපවිත්‍ර ඇති. පාරිශුද්ධකරු ඔහු පමණක් බැවින්, ශංකරාචාර්ය පවා ශිවාව සිහි කරයි. මිනිසුන් කල්පයෙන් භාගයක් භක්තියේ යෙදෙන අතර ඉන්පසුව දෙවියන් පැමිණෙයි. මෙම ගිණුම ගැන කිසිවෙක් නොදනී. පියා විස්තර කරන්නේ යාගහෝම, තපස් රැකීම, දන් දීම ආදියෙන් කිසිවෙකුට මා මුණ ගැසිය නොහැක. ගීතාව ද එහි ඇතුලත්ය. එම ග්‍රන්ථ ශාස්ත්‍ර කියවීමෙන් කිසිවෙකුට විමුක්තිය ලැබෙන්නේ නැත. ගීතාව, වේද සහ උපනිශාද් යන සියල්ල අයත් වන්නේ භක්ති මාර්ගයටයි. පියා ඔය දරුවන්ට පහසු රාජ යෝගාව සහ ඥානය උගන්වන අතර එය මගින් ඔබට රාජධානිය ලබාගැනීමට ඔහු මඟපාදයි. මෙය රාජ යෝගාව ලෙස හැඳින්වෙයි. ආගමික පොත් පිළිබඳ ප්‍රශ්නයක් මෙහි නැත. ඔබට තත්ත්වයක් හිමිකර ගැනීම සඳහා, ගුරුවරයා ඔබට ඉගෙන ගැනීමට දිරිමත් කරයි, එබැවින් ඔබ ඔහුව අනුගමනය කළ යුතුයි. සියලු දෙනාටම පවසන්න ශිව බාබා සිහි කරන්න. ඔහු අප සියලු ජීවාත්මයන්ගේ පියාය. ශිව බාබා සිහි කිරීමෙන් ඔබගේ පාපයන් අහෝසි වෙයි. නොකඩවා එකිනෙකාව දිරිගන්වමින් දියුණු වන්න. ඔබ වැඩියෙන් සිහි කිරීමේ සිටින තරමට ඔබ තමන්ට යහපතක් අත්කර ගනී. සිහිපත් කිරීමේ වන්දනා ගමනෙන් ඔබ මුළු ලොවම පිවිතුරු කරයි. සිහිපත් කිරීමේ සිටින අතර ආහාර පිලියෙල කරන්න, එවිට එය බලයෙන් පිරෙයි. ඔබගේ බ්‍රහ්ම භෝජන ගැන බොහෝ ප්‍රශංසා තිබෙන්නේ මේ නිසයි. ඒ බැතිමතුන් භෝග් පූජා කරන විට ඔවුන් නොකඩවා රාමාගේ නාමය මතුරයි. ඔවුන් රාමාගේ නමින් දන් දෙයි. ඔබගේ බුද්ධිය තුළ නැවත නැවතත් පියාගේ සිහි කිරීම තිබිය යුතුයි. දවස පුරාම ඔබගේ බුද්ධිය තුළ දැනුම රැඳී තිබිය යුතුයි. මුළු නිර්මාණයේම මුල, මැද සහ අවසානය පිළිබඳ දැනුම පියා තුළ තිබේ. උසස්ම-උසස් වන්නේ දෙවියන්ය. ඔබ ඔහු සිහි කරන විට ඔබට උසස් තත්ත්වයක් හිමි වෙයි. එසේ නම් ඔබ වෙනත් කෙනෙක් සිහි කරන්නේ කුමටද? පියා පවසන්නේ මා පමණක් සිහි කරන්න, එපමණයි. එබැවින් ඔබ අන් සියලු දෙනා අත්හැරිය යුතුයි. අමිශ්‍ර සිහි කිරීම මෙයයි. ඔබට සිහි කිරීමට නොහැකි නම් ගැටයක් ගසන්න. තමන්ගේම ප්‍රගතිය වෙනුවෙන් සහ උසස් තත්ත්වයක් හිමි කරගැනීමට ඔබ අනිවාර්යෙන් උත්සාහ දැරිය යුතුයි. අපව ගුරුවරුන් බවට පත් කරන අපගේ ගුරුවරයා, ශිව බාබාය. ඔබ සියලු දෙනාම මඟපෙන්වන්නන්ය. මඟපෙන්වන්නන්ගේ වගකීම

වන්නේ මාර්ගය පෙන්වීමයි. මින් පෙර ඔබ තුළ, මේ කිසිදු දැනුමක් තිබුණේ නැත. සෑම කෙනෙක්ම පවසන්නේ පෙරකල, ඉගෙනුමෙහි වටිනාකම, පැන්ස කිහිපයක් පමණක් විය. එය අනිවාර්යෙන් එසේ වන්නට ඇති. නාටකයට අනුව, ඔබ පෙර කල්පයේදී කළ ආකාරයෙන්ම දිගටම ඉගෙන ගන්නා අතර, කල්පයකට පසුවත් ඔබ එයම කරයි. අවසානයේ ඔබට සෑම දේකම දර්ශන ලැබෙයි. දර්ශනයක් ලැබීමට වැඩි කාලයක් ගත වන්නේ නැත. බාබාට ඉතා විගසින් දර්ශන ලැබුණි. අහවලා රජෙක් වන අතර ඔහුගේ ඇඳුම, මෙය වෙයි. ආරම්භයේදී ඔය දරුවන්ට බොහෝ දර්ශන ලැබුණු අතර අවසානයේද ඔබට බොහෝ දර්ශන ලැබෙයි. එවිට ඔබට සිහිවනු ඇත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ආහාර ගන්න වෙලාවට, පියා ගැන එකිනෙකාට මතක් කර දෙන්න. සිහිපත් කිරීමේ සිට ඔබගේ ආහාර ගන්න. ඒකායන ශිව බාබාට පමණක් සැබෑ සෙනෙහස පාන්න.
2. ඔබගේ ඇට මිදුළු වලින් යග්‍යාවට සේවය කරන්න. පියාගේ සම්පූර්ණ උදව්කරුවන් වන්න.

**වරදානය:** බුද්ධියේ විශ්වාසය තිබීමෙන් සහ දුර්වල සිතිවිලිවල දැල අවසන් කිරීමෙන්, ඔබ සාර්ථකත්වයෙන් පිරේවා.
මේ වන තුරු, දරුවන් වැඩි දෙනෙක් තුළ දුර්වල සිතිවිලි ඉස්මතු වෙයි. ඔවුන් සිතන්නේ යමක් සිදුවෙයිද නැද්ද, හෝ කුමක් වෙයිද කියා, මා දන්නේ නැහැ. මෙම දුර්වල සිතිවිලි බැම්මක් වී, සාර්ථකත්වය එම බැම්ම පිටුපස සැඟව යයි. මායා නිෂ්ඵල සිතිවිලි දැළක් කටින අතර, ඔබ එම දැළ තුළ සිර වෙයි. එබැවින් බුද්ධියේ විශ්වාසය තිබීම, ජය ලැබීම සහ සාර්ථකත්වයේ ජන්ම උරුමයක් තිබීමේ අවධානයෙන්, දුර්වල සිතිවිලි අවසන් කරන්න.

**පාඨය:** ඔබගේ තෙවැනි ඇස, ඔබගේ ගිණි කන්දක් වැනි ඇස, විවෘතව තබාගන්න, එවිට මායා බල රහිත වෙයි.

***** ඕම් ශාන්ති *****

.

**මාතේශ්වරී විසින් සියලුම ගෝප් සහ ගෝපිලියන් වෙත ලියන ලද සිහිපත් කිරීමේ ලිපිය (1961).**

**සියලුම ගෝප් සහ ගෝපිලියන්හට ගැඹුරු සෙනෙහස සහ සිහි කිරීම.**

ඔබගේ පවුලේ අය සමඟ නිවසේ වාසය කරමින් නෙළුම් මලක් වැනි ජීවිතයක් ගත කරන අතර, ඔබ සාර්ථකත්වයෙන් ඉදිරියට ගමන් කරනවා නේද? ආදරණීය ගෝප්ලා ඉතා හොඳින් සේවය ඉහළ නැංවීම සඳහා උත්සාහ දරමින් සිටිනවා මෙය ඉතා හොඳයි. යථා කාලයේදී සියලු දෙනාටම අපගේ උත්තරීතර ලෙස පිදුම් ලබන්නට සුදුසු පියාගේ හැඳින්වීම නිසැකවම ලැබෙයි. මෙම ශ්‍රේෂ්ඨ ලැබීම ලබා ගැනීමට හැකි වන්නේ, කෝටි ගණනකින් අතලොස්සකට පමණක් බව ඔබ දන්නවා. කෙසේවෙතත්, එවන් මල් ද අනිවාර්යෙන් මතුවෙයි, එහෙම නේද? අච්චා. සීඝ්‍ර වේගයකින් නොකඩවා සේවය වැඩි කරන්න. ඥානයේ අවිනාශී ධන සම්පත, මුළුමණින්ම අසහාය මෙන්ම නොනිමි වන අතර සියලුම දරුවන්ට එය අඛණ්ඩව පියාගෙන් ලැබෙයි. එය යම් කෙනෙකුට ලැබුණු විට, ඔහු උපතින් උපතට සියලු සම්පත් වලින් පිරෙයි. මේ දෙය එවැනිය. ආදරණීය ගෝප් සහ ගෝපිලියන් මට කියන්න, මෙය නිවැරදි නේද?

ඔය සියලුම ගොපල ගෝපිලියන්, අතීන්ද්‍රිය සතුට පිරි දිවියක් අත්දකිමින් නොකඩවා ඉදිරියට ගමන් කරනවා. බලන්න, ආදරණීය ගොපල ගෝපිලියනේ, සියලු දෙනාටම යහපතක් ඇති වන්නේ, බ්‍රහ්මන වංශය වර්ධනය වන විට පමණයි. එවිට ඔය බ්‍රහ්මනයන් නියත වශයෙන්ම දේවතාවන් වෙයි. සමහරු තම පවුල් දිවියේ ගමන් කරමින් බ්‍රහ්මන වංශයේ සාමාජිකයෙක් ලෙසත් ගමන් කරයි, එනම්, තම පවුලේ අය සමඟ නිවසේ වාසය

කරන අතර, ඔවුන් පිවිතුරු ජීවිත ගත කරනවා. සැමියා සහ බිරිඳ යන දෙදෙනාම, එක පියාගේ දරුවන්ය, එමෙන්ම ඔවුන් එවන් පිවිතුරු ධාරණයක් පවත්වාගනී. කෙසේවෙතත් සියලු දෙනාම පරම පියා, පරමාත්ම ජීවයගේ උපදෙස් අනුගමනය කළ යුතුයි. මෙය ශ්‍රීමත් අනුගමනය කිරීම ලෙස හැඳින්වෙයි. එවන් ධාරණාවක් ඇති අය, බ්‍රහ්මන වංශයේ සාමාජිකයන් බව කියයි. ඔහු දැන් අපගේ පියා, ගුරුවරයා, සත්ගුරු සහ ධර්මරාජ් ද වී ඇති බැවින්, අපි ඔහුගේ හදාගත් දරුවන් වී, එමගින් අනාගතයේ සාමය සහ සතුට වෙනුවෙන් සම්පූර්ණ අයිතිය හිමි කරගැනීමට හැකි වන, පාරිශුද්ධත්වයේ සම්පූර්ණ අයිතිවාසිකම ලබා නොගන්නේ මන්ද?

ආදරණීය ගොපල ගෝපිලියන් මට කියන්න, ඔබ මෙම රහස පහසුවෙන් වටහාගෙන තිබෙනවා නේද? ඔබ ජීවමානව මියැදීමට බිය වන්නේ නැහැ නේද? ඔබ සෑම කෙනෙක්ම මෙම ලිපිය පෞද්ගලිකවම ඔබගේ නමින් කාරුණිකව පිලිගෙන, එය කියවා හෝ එයට සවන් දිය යුතතේ, එය ඔබටම ලියූ ලිපියක් ලෙස සලකමින්ය, මන්ද සෑම කෙනෙක්ම මවගේ සෙනෙහස, ඔබේ නමින් පෞද්ගලිකවම ලබාගත යුතුයි. මවගේ ගැඹුරු නොනිමි සෙනෙහස පෞද්ගලිකව, නමින්, සෑම ගොපල ගෝපිලියක් වෙනුවෙනි. අච්චා. සීඝ්‍ර වේගයකින් ඔබගේ භාග්‍යය, මෙතරම් උසස් කරගැනීමේ උත්සාහයේ යෙදී සිටීම යනු, සෙත සලසන්නෙක් වීමයි. පරම පියාම දැන් ඔබට උසස්ම උරුමය ලබා දීමට පැමිණ ඇති බව ඔබ දැන් දන්නා බැවින්, ඔබ අනිවාර්යෙන් එය ලබාගත යුතුයි. අච්චා. මා දැන් පිටත්ව යනවා. ඕම් ශාන්ති.

**බ්‍රහ්ම පියාට සමාන වීම සඳහා විශේෂ උත්සාහයන්.**

බ්‍රහ්ම පියා, සියලුම 'මගේ, මගේ' යන්න, එක 'මගේ' තුළ මුසු කර ඇත. මගේ වන්නේ එක් පියා හැර වෙනත් කිසිවෙක් නොවෙයි. මේ ආකාරයෙන් පියා අනුගමනය කරන්න, එවිට මේ ආකාරයෙන් ඔබගේ ඒකාග්‍රතා බලය වැඩිවෙයි. එවිට ඔබගේ මනස, ඔබට අවශ්‍ය තැනක, ඔබට අවශ්‍ය අන්දමට, ඔබට අවශ්‍ය කාලයක්, අවශ්‍ය ඕනෑම ආකාරයකට එක්තැන් වෙයි. මෙම ඒකාග්‍රතාවයේ බලයෙන් ඔබ ඉබේටම නිරන්තර සහ ස්ථාවර සුරහන ස්ජීතිය අත්දකීවි.